(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 1(9).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2020 ඔක්තෝබර් 07 බදාදා**

---

**2020 ඔක්තෝබර් 20 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

17/2020

ගරු හේෂා විතානගේ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ දිසා අධිකරණ වෙත යොමු වී ඇති පැමිණිලි අතරින්, මෙතෙක් විභාග නොවූ සහ විභාග වෙමින් පවතින නඩු තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, අදාළ නඩු අංක සහ ඒවා පැවරූ දින වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ඇ) ඉහත නඩු වලින් —

(i) වසර 01 – 05 අතර;
(ii) වසර 05 – 10 අතර;
(iii) වසර 10 – 15 අතර;
(iv) වසර 15 -20 අතර;
(v) වසර 20 – 25 අතර;
(vi) වසර 25කට වඩා වැඩි;

කාලයක් විභාග වන පැරණි නඩු කවරේදැයි අදාළ නඩු අංක හා පැවරූ / ලේඛනගත වූ දින සමඟ වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

130/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන මහ නගර සභා සංඛ්‍යාව කොපමණද;
(ii) ඒවායේ නම් කවරේද;
(iii) එම මහ නගර සභා අතරින් කසළ ඉවත් කිරීම පෞද්ගලික ආයතන වෙත භාර දී ඇති මහ නගර සභාවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහ නගර සභාවල කසළ ඉවත් කිරීම භාරගත් පෞද්ගලික සමාගම්වල නම් කවරේද;
(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඉහත සමාගම් වෙත ගෙවා ඇති මුදල කොපමණද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම පළාත් පාලන ආයතනවල සේවකයන් යොදවා සිය පළාත් පාලන බලප්‍රදේශයේ කසළ ඉවත් කරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

150/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මූල්‍ය (Finance) පහසුකම් ලබාගත් පාරිභෝගිකයන්ට එම වාරික ආපසු ගෙවීම සඳහා කොවිඩ් - 19 වසංගත කාලයේදී රජය විසින් ලබා දීමට පොරොන්දු වූ මාස 6ක සහන කාලය සම්බන්ධයෙන් අදාළ මූල්‍ය සමාගම් දැනුවත් කිරීමක් සිදු වූයේද;

(ii) එසේ නම්, එම සහනය, මූල්‍ය (Finance) පහසුකම් ලබාගත් පාරිභෝගිකයන්ට ලැබුණු බවට තහවුරු කළ හැකිද;

(iii) එම සහනය පාරිභෝගිකයන්ට නොලැබුනේ නම්, එයට හේතුව කවරේද;

(iv) එම හේතුව මත අසාධාරණයට ලක් වූ පාරිභෝගිකයන් සම්බන්ධයෙන් රජය ගනු ලබන ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

433/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ පරිසර පද්ධතිය ආරක්ෂා වීමට වනාන්තර දැඩි ලෙස උපකාරීවන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පවතින වන සනත්වය ප්‍රතිශතයක් ලෙස කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ පැවතිය යුතු වන සනත්වය කවරේද;

(iii) අවශ්‍ය වන සනත්වය නොමැති නම්, එය සපුරා ගැනීමට වැඩපිළිවෙළක් සකස්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

480/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති වාරිමාර්ග රක්ෂිතවල නම් කවරේද;

(ii) එකී රක්ෂිතවලට අයිති ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අනවසර වගාකරුවන් විසින් එකී රක්ෂිතවලට අයත් ඉඩම් අත්පත් කරගෙන සිටින බව එතුමා දන්නෙහිද?

(ඇ) එකී අනවසර වගාකරුවන් ඉවත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

**2020 ඔක්තෝබර් 21 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

131/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 වර්ෂයේ සිට මේ දක්වා රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද මත් කුඩු ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම මත් කුඩුවලින් යම් ප්‍රමාණයක් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අතට පත්ව තිබෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඒ සම්බන්ධව යම් පුද්ගලයන් අත්අඩංගුවට ගෙන තිබේ නම්, ඔවුන්ගේ නම් හා තනතුරු නාමයන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) අනාගතයේදී මෙවැනි තත්වයක් ඇති නොවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

151/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 14, ශ්‍රී සංඝබෝධි මහා විද්‍යාලයේ ඇති තෙමහල් ගොඩනැගිල්ලේ වහලය දිරාපත්ව එහි කොටසක් කඩා වැටී ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් සිසු දරුවන් අනාරක්ෂිතභාවයට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

434/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) ඩෙංගු රෝගය විවිධ අවස්ථාවලදී ශ්‍රී ලංකාව තුළ වර්ධනය වන බව එතුමිය පිළිගන්නෙහිද?

(ආ) (i) 2019 වසර තුළ ඩෙංගු රෝගය හේතුවෙන් අහිමි වූ ජීවිත සංඛ්‍යාව කොපමණද;

(ii) ඩෙංගු රෝගය මර්දනය සඳහා ජාතික හා ප්‍රාදේශීය වශයෙන් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iii) ප්‍රාදේශීය ඩෙංගු මර්දන වැඩපිළිවෙළ සඳහා බඳවා ගත් කම්කරුවන් පිරිසක් සිටින බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඔවුන්ගේ සේවය අඛණ්ඩව ලබා ගැනීමට සැලැස්මක් තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

448/2020

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන මද්‍රසා පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් පිහිටි ස්ථානවල ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2019 වර්ෂයේදී සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු මෙම මද්‍රසා පාසල් පිළිබඳ විශාල කතිකාවක් සමාජය තුළ ඇති වී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) මෙම මද්‍රසා පාසල් නියාමනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර;

(ii) එම පාසල් සම්බන්ධව වත්මන් රජයේ ස්ථාවරය;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

481/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව, පරණ එළුවන්කුලම ප්‍රදේශයේ කාලයක් තිස්සේ කැනීම් බලපත්‍ර නොමැතිව නීතිවිරෝධී ලෙස වැලි කැනීමේ ජාවාරම සිදුකරගෙන යන බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම නීති විරෝධී වැලි කැනීම් ජාවාරම මැඩපැවැත්වීමට අමාත්‍යාංශය විසින්,

(i) මෙතෙක් ගෙන ඇති පියවර;

(ii) ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත පියවර;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 ඔක්තෝබර් 22 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

152/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 14, සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ පිහිටි බ්ලූමැන්ඩල් විද්‍යාලයේ සිසු දරුවන් 400ක් පමණ අධ්‍යාපනය ලබන අතර එහි මලාපවහන පද්ධතිය පිළිසකර නොකිරීම හේතුවෙන් ගලි පියන් වෙනුවට ලෑලි යොදා වසා ඇති බවත්;

(ii) එම සිසු දරුවන් සඳහා නිසි වැසිකිළි පහසුකම් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

192/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු හා නැගෙනහිර පළාත්වල පාලම් 1000ක් ඉදිකිරීමේ වැඩසටහන ඔබ අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද වැඩසටහනක් බවත්;

(ii) එම සැලැස්ම එම ප්‍රදේශවල අවශ්‍යතාවයන්ට නොගැලපෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම වැඩසටහන යටතේ —

(i) උතුරු පළාතේ එක් එක් දිස්ත්‍රික්කය තුළ ඉදිකරන ලද පාලම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඉදිකිරීම්වලට සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලම ඉදිකිරීමේ වැඩසටහන සඳහා වන සැලසුම් අදාළ ප්‍රදේශවලට ගැලපෙන අයුරින් සකස් කරනු ලැබුවේද;

(ii) නොඑසේ නම්, විදේශයකදී සකස් කරන ලද සැලසුම් අනුව ක්‍රියාත්මක කරනු ලැබුවේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) මෙම වැඩසටහන යටතේ කිළිනොච්චි දිස්ත්‍රික්කය සඳහා —

(i) ඉදිකිරීමට යෝජිත පාලම් සංඛ්‍යාව;

(ii) මුදල් වෙන් කරන ලද පාලම් සංඛ්‍යාව;

(iii) මුදල් වෙන් කරන ලද පාලම් අතරින් වැඩ අවසන් කළ සංඛ්‍යාව;

(iv) මුදල් වෙන් කරන ලද පාලම් අතරින් වැඩ අවසන් නොකළ සංඛ්‍යාව;

(v) තවදුරටත් ඉදිකිරීමට ඇති පාලම් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

307/2020

ගරු වේලු කුමාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, දෙමළ මාධ්‍ය පාසල්වල සිටින ශ්‍රී ලංකා විදුහල්පති සේවයට අයත් නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ඔවුන් මේ වනවිට සේවයේ නියුතු පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මහනුවර දිස්ත්‍රික්කය තුළ සිටින —

(i) විදුහල්පති සේවයේ ශ්‍රේණිධාරී පත්වීමක් ලැබුණද ශ්‍රේණියට අදාළව විදුහල්පති පත්වීමක් නොලද නිලධාරින් සංඛ්‍යාව;

(ii) විදුහල්පති සේවයේ සුදුසුකම් නොමැති, එහෙත් දෙමළ මාධ්‍ය පාසල්වල විදුහල්පතිවරුන් ලෙස පත්වීම් ලබා ඇති නිලධාරින් සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (ආ)(ii)හි සඳහන් පත්වීම් ලබාඇති ගුරුවරුන්ගේ විස්තර සහ ඔවුන් මේ වනවිට සේවය කරන පාසල් කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

436/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඉඩම් නොමැති හා දැනටමත් පදිංචි ඉඩමට ඔප්පුවක් නොමැති විශාල පවුල් සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේ සිටින බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම පවුල් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන තිබේද;

(ii) පදිංචි ඉඩමට ඔප්පුවක් නොමැති පවුල් සඳහා ඔප්පු ලබා දීමට පියවර ගන්නේද;

(iii) පදිංචිය සඳහා ඉඩම් නොමැති පවුල් වෙනුවෙන් ඉඩම් ලබා දීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ඉඩම් හඳුනාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

449/2020

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමාජයේ ඉමහත් කතිතාවකට ලක් වූ බැටිකලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය ස්ථාපිත කළ දිනය;

(ii) ඒ සඳහා මුදල් වැය කළ පුද්ගලයින් හා ආයතනවල නම්;

(iii) එහි පාලක මණ්ඩලයේ සිටි පුද්ගලයින්ගේ නම්;

(iv) එම ආයතනය විසින් පැවැත්වීමට නියමිතව තිබූ පාඨමාලා සංඛ්‍යාව;

(v) එම පාඨමාලාවල නම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ආයතනයේ පැවැත්වීමට නියමිත පාඨමාලා අතරට ශරියා නීතිය පිළිබඳ පාඨමාලාවක් ඇතුළත් කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත ආයතනය සම්බන්ධව වත්මන් රජයේ ස්ථාවරය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

482/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය දැඩි මූල්‍ය අර්බුදයකට ලක් වී තිබෙන බවත්;

(ii) ඒ හේතුවෙන් සේවක වැටුප් ගෙවීමට පවා දුෂ්කර වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මේ වනවිට සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන්ට අඩ වැටුප් සමඟ මාස තුනක් නිවාඩු ලබා දීමට තීරණය කර තිබේද;

(iii) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 ඔක්තෝබර් 23 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

18/2020

ගරු හේෂා විතානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා නව බස් රථ 2200ක් ගෙන්වා ඇති බවත්;

(ii) මෙම බස් රථ ලබා දී ඇත්තේ කල්බදු ක්‍රමය යටතේ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේ සිට එම කල්බදු ගෙවීම් නතර කර තිබේද;

(ii) එසේ නම්, එයට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

107/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) විනාකිරි නිෂ්පාදනයට යොදා ගනු ලබන රාවල ගුණාත්මකභාවය නියාමනයට ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විනාකිරි නිෂ්පාදනය සඳහා කෘත්‍රිම රා යොදා ගන්නා බවත්;

(ii) රසායනික විෂ සහිත මෙම කෘත්‍රිම රා භාවිතය ජනතාවගේ සෞඛ්‍යයට තර්ජනයක් බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ඇ) (i) විනාකිරි නිෂ්පාදනය සඳහා කෘත්‍රිම රා යොදා ගැනීම වැළැක්වීමට ගනු ලබන පියවර සඳහන් කරන්නේද;

(ii) කෘත්‍රිම රාවලින් නිෂ්පාදනය කරනු ලබන විනාකිරි භාවිතා කිරීම හේතුවෙන් ඇතිවිය හැකි කෙටි කාලීන හා දිගු කාලීන රෝගාබාධයන් කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

153/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 15, ආවේ මරියා විද්‍යාලයේ කතෝලික ධර්මය හා පෙරදිග සංගීතය විෂයයන් සඳහා ද ප්‍රාථමික පොදු අංශයේද ගුරු පුරප්පාඩු 01 බැගින් පවතින බවත්;

(ii) වැසි ජලය බැස යාමේ නිසි ක්‍රමවේදයක් නොමැතිකම හේතුවෙන් මෙම විද්‍යාලයේ ඇති කුඩා ක්‍රීඩාංගණය වැසි ජලයෙන් යටවීමෙන් සිසු දරුවන්ගේ ක්‍රීඩා කටයුතුවලට බාධාවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම ගැටලු විසඳීම සඳහා අමාත්‍යාංශය මගින් ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

193/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ ස්ථිරව පදිංචි පවුල්වලට හිමි ඉඩම් ප්‍රමාණය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සින්නක්කර ඔප්පු හිමි පවුල් සංඛ්‍යාව සහ එම පවුල්වල සාමාජිකයන් සංඛ්‍යාව;

(ii) ඉඩම් බලපත්‍ර ඇති පවුල් සංඛ්‍යාව සහ එම පවුල්වල සාමාජිකයන් සංඛ්‍යාව;

(iii) බලපත්‍ර සහිත කුඹුරු ඉඩම් ප්‍රමාණය සහ ගොඩ ඉඩම් ප්‍රමාණය;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ වර්ෂ 60කට වඩා වැඩි කාලයක් ජීවත් වන ජනතාවට සින්නක්කර ඔප්පු මෙතෙක් ලබා දී නොමැති බවත්;

(ii) යුද්ධයෙන් පීඩාවට පත් එම ජනතාවට ඔප්පු ලබා නොදීම හේතුවෙන් බැංකුවලින් හා මූල්‍ය ආයතනවලින් උකස් හා ණය පහසුකම් ලබා ගැනීම දුෂ්කර වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ ජනතාවට සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

(ii) මේ වනවිට සින්නක්කර ඔප්පු හෝ බලපත්‍ර නොමැතිව ජීවත්වන ඉඩම් හිමි පවුල් සංඛ්‍යාව සහ එම පවුල්වල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

348/2020

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නීතිමය තත්ත්වය කෙසේ වුවත්, සංවේදී පරිසර පද්ධතියක මාර්ගයක් ඉදිකරන විට ඒ සඳහා පරිසර බලපෑම් අධ්‍යයනයක් සිදු කළ යුතු බව පරිසරවේදීන් ඇතුළු බහුතර ජනතාවගේ අදහස බැවින් එවැනි අධ්‍යයනයක් සිදු කළ යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, සංවේදී පරිසර පද්ධතියක් හා ලෝක උරුමයක් වන සිංහරාජ වනාන්තරය හරහා ලංකාගම නමැති ග්‍රාමය වෙත පාරක් කැපීම සඳහා එවැනි අධ්‍යයනයක් සිදු කර තිබේද;

(ii) නොඑසේ නම්, එවැනි අධ්‍යයනයක් සිදු කිරීමට අපේක්ෂා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (අ)හි සඳහන් අදහස පිළිනොගන්නේ නම්, එයට හේතුව කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

437/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය වෙනුවෙන් විදුහල්පතිවරුන් හා ගුරුවරුන් විශාල සේවාවක් සිදුකරන බවත්;

(ii) විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ වැටුප් විෂමතාවයන් පවතින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ට වැටුප් ගෙවීම වෙනුවෙන් වාර්ෂිකව වැයවන මුදල දළ වශයෙන් කොපමණද;

(ii) විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ වැටුප්වල පවතින විෂමතාවයන් ඉවත් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වැඩපිළිවෙලක් සකස්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

450/2020

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය (International Committee of the Red Cross - ICRC) හරහා පකිස්ථානයේ හා ඇෆ්ගනිස්ථානයේ සිට මෙරටට පැමිණි සරණාගතයන් සංඛ්‍යාව;

(ii) එම සරණාගතයන් දැනට රඳවා සිටින ස්ථාන;

(iii) එම සරණාගතයන්ට ලබාදෙන පහසුකම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙසේ වෙනත් රටවල සරණාගතයන් ශ්‍රී ලංකාවට භාරගැනීම හේතුවෙන් මෙරටේ සමාජ, ආර්ථික දේහයට දැඩි බරක් පැටවෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

483/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකාවේ වගා බිම්වල පලිබෝධ නාශක, වල් නාශක සහ පොහොර භාවිතය පිළිබඳ පර්යේෂණයක් සිදු කර තිබෙන බවත්;

(ii) පලිබෝධ නාශක, වල් නාශක සහ පොහොර භාවිතකර වගා කරන රටවල් අතරින් ශ්‍රී ලංකාව ඉදිරියෙන් සිටින රටක් බවට පත්ව තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) පලිබෝධ නාශක, වල් නාශක සහ පොහොර භාවිතකර වගා කටයුතු සිදුකිරීම අවම කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

491/2020

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ආනවිලුන්දාව කුරුළු අභය භූමිය (රම්සා තෙත්බිම) තුළ දැනට අනවසර ඉස්සන් වගාව සිදුවන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ප්‍රදේශය තුළ, ඉස්සන් වගාව සිදු කරන ලද කොටු අත්හැරීම මෙන්ම, ඒවා නැවත ප්‍රතිසංස්කරණය කරමින් භාවිතා කරන බව එතුමා පිළිගන්නේද;

(ii) ඉහත අනවසර ඉස්සන් වගාව නවතා දැමීමට ගනු ලැබූ පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

499/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති මහවැලි කලාපයන්ට අයත් ගම්මාන අතරින් බලපත්‍ර නොමැති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් සඳහා බලපත්‍ර ලබා නොදීමට හේතුව කවරේද;

(iii) බලපත්‍ර නොමැති ඉඩම් සඳහා බලපත්‍ර ලබා දීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මහවැලි කලාපයට අයත් ඉඩම් සඳහා බලපත්‍ර ලබා නොදීම හේතුවෙන් පැන නැගී ඇති ගැටලුව විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

426/2020

ගරු ජගත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වනවිට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කරන—

(i) සමෘද්ධි සංවර්ධන නිලධාරින්;

(ii) සමෘද්ධි කළමණාකරුවන්;

(iii) වෙනත් නිලධාරින්;

සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සමෘද්ධි සංවර්ධන නිලධාරි තනතුරෙහි පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පවතින බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, එම පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිරවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඒවා පුරවන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ හා සමෘද්ධි ව්‍යාපාරයේ ගැටලු විසඳන බව "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ දක්වා ඇති බවත්;

(ii) 2015 වර්ෂයට පෙර පැවති රජය විසින් දිවිනැගුම දෙපාර්තමේන්තුව පිහිටුවා සමෘද්ධි නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් හිමිකම තහවුරු කළ බවත්;

(iii) එහෙත් බහුතර සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට මේ වනතෙක් විශ්‍රාම වැටුප් හිමිකම ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඉ) (i) එසේ විශ්‍රාම වැටුප් හිමිකම නොලැබීමට හේතු වූ කරුණු කවරේද;

(ii) එම නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් හිමිකම ලබාදීමේ වැඩපිළිවෙළක් සකස්කර තිබේද;

(iii) එම නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් හිමිකම තහවුරු කරන දිනය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?